(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 1(10).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා**

---

## 2010 ඔක්තෝබර් මස 05 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0126/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පොල් සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනුයේ කලාප 6 ක් යටතේ බව එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 ක්, මෙම කලාප 6 හි නිලධාරීන් විසින් ආවරණය කිරීම තුළ පොල් ගොවීන්ගේ අවශ්‍යතාවයන් නිසියාකාරව ඉටුවන්නේ යැයි එතුමා සෑහීමකට පත්වන්නේද?

(ඇ) මෙම නිලධාරීන් හමුවිය හැක්කේ බදාදා පමණක් වන බැව් එතුමා දන්නෙහිද?

(ඈ) මෙම දිස්ත්‍රික්කයේ පොල් වගා කිරීමේ ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට එම තත්ත්වය බාධාවක් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඉ) මෙම ගැටලු විසඳාලීම පිණිස හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා දැනට අනුමතවී ඇති කලාප 6, කලාප 10 ක් තෙක් වැඩි කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/'10

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1978 - 1988, 1989 - 1994, 1995 - 2009, සහ 2010 සිට මේ දක්වා, යන කාල පරිච්ඡේද තුළ දී රජය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද යන්න වාර්ෂික පදනමින් සහ දිස්ත්‍රික් පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදි කිරීමට නියමිත නිවාස සංඛ්‍යාව වැඩිකිරීම පිණිස ගැනීමට අදහස් කරන පියවර කවරේද;

(ii) නිවාස ඉදිකිරීම සඳහා මුදල් සපයාගන්නා ප්‍රභවයන් මොනවාද සහ අවශ්‍යතාව ඇති ජනතාව අතර මුදල් බෙදා දෙනු ලබන්නේ කුමන ආකාරයටද;

(iii) නිවාස හිමි සමාජයක් ඇති කිරීම උදෙසා ගැනීමට නියමිත පියවර කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0303/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සහ 2009 වර්ෂවල දී ඖෂධ මිල දී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණ ද;

(ii) එම මුදලින් එකී වර්ෂයන් සඳහා අමාත්‍යාංශය වෙත ලැබුණු සත්‍ය මුදල කොපමණ ද;

(iii) එක් එක් වර්ෂය සඳහා ඖෂධ මිලදී ගැනීමට පත් කර තිබෙන කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය කාලයේ ඇති වූ ඖෂධ හිඟයට හේතුව ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0355/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා අයදුම් කළ හැකි උපරිම වයස අවුරුදු 35 ක් විය යුතු බවට රීතියක් පනවන ලද්දේද;

(ii) එය ගැසට් පත්‍රයේ පළ කරන ලද්දේ නම්, එහි පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම රීතිය අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ උපරිම වයසක් නියම කිරීම සඳහා අවශ්‍යතාවයක් තිබේද;

(ii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට හා රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන්හි 27(2)(ඌ) ව්‍යවස්ථාවට පටහැනි නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ, ශ්‍රී ලංකා විවෘත හා විදේශ විශ්වවිද්‍යාලවල නීතිවේදී (එල්.එල්.බී) උපාධිධාරීන්ට ශ්‍රී ලංකා නීතිවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා උපරිම වයසක් නියම කර තිබේද;

(ii) නොඑසේ නම්, නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගයට අදාළව පමණක් වයස් සීමාවක් පැනවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගයට අයදුම් කිරීම සඳහා වයස් සීමාවක් පැනවීමෙන් වළකින ලෙස නීති අධ්‍යාපන සභා ආඥා පනතේ 7(අ) වගන්තිය ප්‍රකාර නියමයක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් , ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1990 ඔක්තෝබර් මස 31 වැනි දිනය වන විට, උතුරු පළාතේ, යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවලට අයත් මුස්ලිම් ජනතාවගේ විවාහ ලියාපදිංචි කිරීම සඳහා එවකට පත්කරනු ලැබ සිටි මුස්ලිම් විවාහ ලේකම්/රෙජිස්ට්‍රාර්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ, එම පත්වීම් කරනු ලැබූ අවස්ථාවේදී, ඔවුන් නියෝජනය කරන ලද මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසය හෝ බල ප්‍රදේශය කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0406/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති;

(i) පර්චස් 4 ට අඩු බිම් ප්‍රමාණයක පිහිටි අඩු පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) අඩු පහසුකම් සහිත අනවසර නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අනවසර නිවාස පිහිටි මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම අඩු පහසුකම් සහිත නිවාස, පහසුකම් සහිත නිවාස බවට පත්කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0408/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ දෙසැම්බර් සිට 2010 වර්ෂයේ අප්‍රේල් දක්වා වූ කාලය තුළ දිවයින තුළ අලුතින් ආරම්භකළ විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අලුතින් ආරම්භ කළ විදුලි බලාගාර මොනවාද;

(iii) ඒවා පිහිටි දිස්ත්‍රික්ක කවරේද;

(iv) මෙසේ අලුතින් විදුලිබලාගාර ඇතිකිරීම තුළින් ජාතික විදුලි බල පද්ධතියට එක් කිරීමට බලාපොරොත්තු වන මෙගාවොට් සංඛ්‍යාව කොපමණද;

(v) අලුතින් ආරම්භ කර ඇති විදුලි බලාගාර සඳහා ඇස්තමේන්තුගත වියදම එක් එක් බලාගාරය සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේ ද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0315/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුලින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0328/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත්වීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(ii) එම පත් කිරීම් කිරීමට බලය ඇති පුද්ගලයා හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iii) එක් වර්ෂයක් තුළ පත් කළ හැකි ජනාධිපති නීතිඥයින් සංඛ්‍යාව කොපමණද;

(iv) 1994 සිට මේ දක්වා පත් කර ඇති ජනාධිපති නීතිඥයින්ගේ නම් සහ වයස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0357/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පානදුර මූලික රෝහලේ තිබෙන,

(i) වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(ii) රෝගීන් සඳහා වූ ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 මැයි මස ඇතිවූ වර්ෂාව හේතුවෙන් ශල්‍යාගාරද ඇතුළත්ව වාට්ටු දෙකක් හැර අනෙක් සියලු වාට්ටු ජලයෙන් යටවූ බවත්;

(ii) මෙම බරපතල තත්ත්වය පසුගිය වර්ෂ කිහිපය තුළම වර්ෂයකට කිහිපවරක් ඇතිවූ බවත්;

(iii) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වහාම පියවර ගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර කවරේද;

(ii) එම කටයුතු කොපමණ කාලයක් තුළ අවසන් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0225/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0344/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 දිනට හිමිකම් ලබමින් සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2009 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2009 දක්වා කාලසීමාවේදී පඩුවස්නුවර නැගෙනහිර හා බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම පුද්ගලයන් ඉවත්කරන ලද පදනම කුමක්ද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකහි සමෘද්ධිලාභීන් ලෙස අලුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2010 ඔක්තෝබර් මස 06 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0246/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල ,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම් එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0359/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාව තුළ ඇති,

(i) රජයේ ජාතික පාසල් සහ රජයේ අනෙකුත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන රජයේ පාසල් සංඛ්‍යාව සහ සියලුම පන්ති සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම් නොකරන නමුත් අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදුකරන රජයේ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉංග්‍රීසි භාෂාව භාවිතය සම්බන්ධ අනාගත අභියෝගවලට මුහුණදීමට සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් දෙකක්වත් වහාම ආරම්භ කළ යුතු බව එතුමා පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඊට ඉදිරිපත් කරන විකල්ප කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0385/'10

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සහ ජංගම දුරකථන සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ගේ නම්, මෙරටේදී ඔවුන් විසින් ගෙවන ලද කොටස් ප්‍රාග්ධනය සහ ඔවුන් ලැබූ ලාභය කොපමණද;

(iii) ඔවුන් ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කටයුතු කළ කාලය කොපමණද;

යන්න එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්ථාවර දුරකථන සේවා මෙහෙයුම්කරුවන් සහ ජංගම දුරකථන මෙහෙයුම්කරුවන්ගෙන් මාසිකව අයකරනු ලබන බදු ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වසර පහක කාලසීමාව තුළ ජංගම සහ ස්ථාවර දුරකථන සේවා සපයන්නන්ගෙන් රජය උපයන ලද මුළු ආදායම කොපමණද;

(iii) පසුගිය වසර හතරක කාලසීමාව තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වාර්ෂිකව උපයන ලද ලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0461/'10

ගරු නුර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචිකිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු පළාතේ පදිංචිව සිටි දැනට පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය, මුන්දලම, වනාතවිල්ලුව සහ පුත්තලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අභ්‍යන්තර අවතැන්වූවන් ලෙස පදිංචි වී සිටින ජනතාව වෙනුවෙන්, ලෝක බැංකු නිවාස ආධාර යටතේ වර්ෂ 2007 සිට මේ වන තෙක් සම්පූර්ණයෙන් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිවාස ඉදිකිරීම් සඳහා වියදම් කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම පදිංචිකරුවන් සඳහා නිවාස ඉදිකිරීමට මූලාධාර පිරිනැමීමේදී අනුගමනය කරන ලද පිළිවෙත කවරේද;

(iv) එය වාරික වශයෙන් ලබාදුන්නේ නම්, එක් එක් වාරිකය සඳහා ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) එම ලෝක බැංකු නිවාස ආධාර වැඩ සටහන යටතේ මුදල් පිරිනමන ලද පුද්ගලයින්ගේ නම්, ලිපිනයන්, දිනයන් සහ චෙක්පත් අංකයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0485/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බහුකාර්ය ජල සම්පත් සැලසුම්කරන ජාතික ව්‍යාපෘතිය යනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එහි අරමුණු කවරේද;

(iii) ගංගා නිම්න සංවර්ධන නමින් වැඩ සටහනක් තිබේද;

(iv) එහි අරමුණ කවරේද;

(v) මෙම වැඩ සටහන් ආරම්භ කර ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘති සඳහා මුදල් ලබා ගන්නේ ණය හෝ ආධාර ලෙස ද;

(ii) එම මුදල් ලබා දෙන ආයතනය හෝ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0247/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල ,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේනම් එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මකව පවතින මුළු ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් ඉන්ධන පිරවුම්හල් අතරින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ වෙනත් ආයතන යටතේ ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් කොපමණද;

(iii) 2010 ජනවාරි මස 01 වැනි දිනට පසු විවෘත කරන ලද ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අළුතින් විවෘත කරන ලද ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාමට ඉඩ ලබා දී ඇති පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හි සඳහන් ඉන්ධන පිරවුම්හල් මගින් පසුගිය මාස 12 තුළ එක් එක් මාසයේදී අලෙවි කරන ලද පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් ආදී ඉන්ධන ලීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0462/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටේ අභ්‍යන්තරව අවතැන්වී සිටින පවුල්වලට අයත් අවිවාහක අයෙකු විවාහ ගිවිස ගැනීමේදී පුද්ගලයින්, දේපල සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය වෙතින් ලබා දෙන මුදල් ආධාරය කොපමණද;

(ii) වර්ෂ 2004 සිට 2010 මැයි මස දක්වා පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය, මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අවතැන්ව සිටින පවුල්වලට අයත්, එම මුදල් ආධාර ලබා දුන් පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) අවතැන්වූ පවුල් දෙකක් අතර විවාහ ගිවිස ගැනීමේදී එම දෙපලටම ලබා දෙන මුදල් ප්‍රමාණය සහ එසේ මුදල් ලබා දුන් අවස්ථා ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) ඉහත (අ)(iii) හි පරිදි සිදු වූ විවාහවීම් සහ එක් අයෙකු අවතැන් පවුලක සාමාජිකයෙකුව සිදු වූ විවාහවීම්වලට අදාළව වර්ෂ 2004-2010 කාලය තුළදී ලබා දුන් මුදල් ප්‍රමාණය, මුදල් ලාභීන්ගේ නම්, ලිපිනයන්, මුදල් නිකුත් කළ දිනයන්, වවුචර් අංක හා දිනයන් කවරේද යන්න ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0466/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(ආ) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අඩාල වී ඇති බවත්, ඒ පිළිබඳව විපක්ෂය වගකිවයුතු බවත් හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා 2010.06.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අඩාල වී තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අඩාල වී ඇත්නම්, එය නැවත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0486/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ මේ වන විට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල සතු මුදල් කොළඹ කොටස් වෙළඳපලෙහි ආයෝජනය කර තිබේද:

(iii) එසේ නම්, එම මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ අයෝජනය කර ඇති සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලින් ලංකා හෝටල් සංස්ථාවේ ආයෝජනය කළ මුදල කොපමණ ද;

(ii) කොළඹ කොටස් වෙළෙඳපොලෙහි සහ ලංකා හෝටල් සංස්ථාවේ ආයෝජනය කිරීමෙන් ලැබී ඇති ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0248/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ පහ තුළදී වාර්තා වූ අසාර්ථක මූල්‍ය සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තැන්පත්කරුවන්ගේ මුදල් භාරගත් සමාගම් මගින් මුදල් ගෙවනු නොලැබූ සමස්ත තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙවීම පැහැර හරින ලද සමාගම් කවරේද;

(iii) මහ බැංකුව මැදිහත් වී කිසිදු සමාගමක් බංකොලොත්භාවයට පත් නොවනු ඇති බවට සහතිකවීමෙන් පසුවත් 2010.06.01 දිනට IFC සහ CIFC තැන්පත්කරුවන්ට තම ඉතිරිකිරීම් අහිමි වූයේ කෙසේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම සමාගම් වල අධ්‍යක්ෂවරුන්ට සිදුවී ඇත්තේ කුමක්ද;

(ii) මෙම මූල්‍ය සමාගම් පිළිබඳ වාර්තා කිරීමේදී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් සම්මතයන් යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0463/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වා වූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම, වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල තරුණියන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස එක් එක් වර්ෂයේ පවත්වන ලද මැහුම් පාඨමාලාවන් ගණන කොපමණද;

(ii) එම මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා එක් එක් වාරයන් සඳහා තෝරා ගන්නා ලද තරුණියන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා වෙන්කරන ලද මුළු මුදල, එයින් වියදම් කරන ලද මුදල සහ එම වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම පාඨමාලාවන් සඳහා පුහුණුකරුවන් ලෙස බඳවා ගන්නා ලද අයවලුන්ගේ සංඛ්‍යාව, නම් සහ ලිපිනයන්, ඔවුන් වෙනුවෙන් ගෙවීම් කළ අකාරය සහ ගෙවන ලද ප්‍රමාණය කවරේද යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0467/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කළ පතිරගේ නිහාල් පෙරේරා සහ එස්. බී. විමලවීර විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අංක එච්.ආර්.සී./5432/03 සහ එච්.ආර්.සී/5798/03 දරන පැමිණිලි සම්බන්ධයෙන් "සහකාර ආරක්ෂක නිලධාරී තනතුරට අනික් පිරිස පත් කළ දින සිට පත්කර, වැටුප් පියවර යථාවත් කළ යුතු බවට" එම කොමිසම 2005.12.12 දින නිර්දේශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2005 අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඳී ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කළ පෙත්සම සම්බන්ධයෙන් 2009.10.22 දින එළැඹි එකඟතාවය පරිදි ඔවුන් දෙදෙනාගේ පත්වීම් තවමත් ලබාදී නැත්තේ මන්ද;

(iii) මහජන පෙත්සම් කාරක සභාව වරාය අධිකාරියේ සභාපති වෙත යැවූ 2009.11.24 සහ 2010.02.09 දිනැති ලිපිවල සඳහන් නියමයන් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iv) එම කාරක සභාවේදී ඇතිවූ එකඟතාවය අනුව අදාළ පත්වීම් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0487/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ශ්‍රී ලංකාව තුළ පුරප්පාඩු වී ඇති ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) මෙයට පෙර පැවති තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, නව ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු ලෙසට රජය විසින් ඉදිරිපත් කරන සුදුසුකම් කවරේද;

(iv) නව බඳවා ගැනීම් සඳහා නැවත තරඟ විභාගයක් පවත්වන්නේද;

(v) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ඔක්තෝබර් මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0249/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0390/'10

ගරු රවුෆ් හකීම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අකුරැස්ස, ගොඩවත්ත පාර, ගොඩපිටිය ලිපිනයෙහි පදිංචි එම්. ඒ. සිත්ති පස්ලිහා මහත්මිය අකුරැස්ස සී/ස රුහුණු බස් සමාගමට අයත් අකුරැස්ස ඩිපෝවේ vi ශ්‍රේණියේ ලිපිකාරිනියක ලෙස සේවය කළ බවත්;

(ii) පරිපාලනමය විෂමචාර චෝදනාවක් මත 2004.12.17 දින සිට අර්ධ වැටුප් සහිතව ඇයගේ සේවය අත්හිටවූ බවත්;

(iii) නැවත විනය පරීක්ෂණ මණ්ඩල තීරණයක් අනුව, 2005.06.01 දින සිට ඇය සේවයෙන් පහ කළ බවත්;

(iv) මේ සම්බන්ධයෙන් පස්ලිහා මහත්මිය විසින් මාතර කම්කරු විනිශ්චය සභාවේ ගොනු කළ නඩුව (අංක L/T/M26/70/2005) නිශ්ප්‍රභා කරන ලද බවත්;

(v) අනතුරුව දකුණු පළාත් සිවිල් අභියාචනා මහාධිකරණය (මාතර) වෙත අභියාචනයක් (අංක S/P/HCCA/MA/L/T06/2009) ඉදිරිපත් කළ බවත්;

(vi) ඒ අනුව, 2010.05.04 දින අධිකරණය මගින් පස්ලිහා මහත්මිය නැවත සේවයේ පිහිටුවීමටත්, සේවය අත්හිටවූ කාලයට අදාළ හිඟවැටුප් සියල්ල ගෙවීමටත් නියෝග කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අධිකරණ නියෝග මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතුව කුමක්ද;

(ii) පස්ලිහා මහත්මිය වහාම සේවයේ පිහිටුවා අදාළ හිඟ වැටුප් ගෙවීමට නොපමාව පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0420/'10

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ අංක. 175 සී කොටසෙහි පිහිටි වර්ග අඩි 4536 ක ගබඩාව, කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ, අංක 345, දරන ස්ථානයේ පිහිටි ග්ලෝබල් තේ බැගස් සමාගමට මාසික කුලිය රු.58968/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරුවන් විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, ඊට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) බදුකරු නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(v) එසේ නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වග කිවයුත්තෝ කවරහුද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0445/’10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් රක්ෂණ සැලැස්මක් තුළින් ආරක්ෂා කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, එවැනි රක්ෂණ ආවරණයක් සඳහා එක් පුද්ගලයකුගෙන් කොපමණ මුදලක් අයකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී ඉල්ලා සිටි රක්ෂණ හිමිකම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රක්ෂණ ගිවිසුම සඳහා මුදල් ගෙවා තිබුනද, රක්ෂණ හිමි පුද්ගලයන්ට හිමිකම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0464/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වාවූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල කාන්තාවන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස ලබා දෙන ලද මහන මැසින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මහන මැසින්ලාභීන්ගේ නම්, ලිපිනයන්, ඒවා නිකුත් කළ දිනයන් සහ එම වවුචර්පත් අංක කවරේද;

(iii) එම එක් එක් මහන මැසිමේ වටිනාකම සහ එක් එක් මහන මැසිම මිලදී ගැනීම සඳහා වියදම් කළ මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුළු මුදල කොපමණද;

(ii) එයින් වියදම් කළ මුදල කොපමණද;

(iii) වියදම් සිදු කළ වැය ශීර්ෂය කවරේද;

යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0488/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට බන්ධනාගාර තුළ දඩ මුදල් ගෙවාගත නොහැකිව සිරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිරකරුවන් සම්බන්ධව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රස පරීක්ෂක වාර්තා නොමැති නිසා සිරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිරකරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0504/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පානීය ජල අවශ්‍යතාව සපුරාලිය යුතු ප්‍රදේශ රාශියක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එම පානීය ජල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දඹදෙණිය ප්‍රදේශයේ විශේෂ ජල ව්‍යාපෘතියක් අරඹා ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියේ පළමු අදියර පමණක් නිමකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එහි දෙවැනි අදියර ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0250/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0452/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හිඟුරාන සීනි කම්හල හෝ ඉන් කොටසක් සීමාසහිත බ්‍රවුන් සහ සමාගම ඇතුළුව පුද්ගලික පාර්ශ්වවලට ලබා දී තිබේද;

(ii) මෙම කම්හලේ කොටස් හිමි සියලු පුද්ගලික අංශයේ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(iii) එය ලබාදුන් දිනය, ලබා දුන් මිල සහ එය ලබාදීමේදී අනුගමනය කළ නියමයන් කවරේද;

(iv) පුද්ගලික අංශයෙන් විවෘත තරඟකාරී මිල ගණන් කැඳවූයේද;

(v) නොඑසේ නම්, ඊට හේතුව කවරේද;

(vi) මිල ගණන් කැඳවූයේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් පාර්ශ්වවල නම් කවරේද;

(vii) එම මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිඟුරාන සීනි කම්හලේ වත්මන් තත්ත්වය කුමක්ද;

(ii) රජය පුද්ගලීකරණයට එරෙහිද;

(iii) ඉහත (ආ) හි දැක්වූ ගනුදෙනුව පුද්ගලීකරණයක්ද;

(iv) නොඑසේ නම්, එය කෙලෙස හඳුන්වන්නේද;

(v) බ්‍රවුන් සහ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා දැනුම් දෙන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0489/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සබඳතා සහ ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සේවය කරන මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සඳහා දැනට ගෙවනු ලබන වැටුප දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී පෞද්ගලික අංශයේ සේවක වැටුප් වැඩි කිරීම සම්බන්ධව කම්කරු අමාත්‍යවරයා වශයෙන් එතුමා තීන්දුවක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව පෞද්ගලික ආයතන සමඟ අත්සන් කළ ගිවිසුම් සංඛ්‍යාව කොපමණ ද;

(iii) ඒ ඒ ක්ෂේත්‍රවල අත්සන් කළ ගිවිසුම්වල සඳහන් අවම වැටුප් අගයන් කවරේද;

(iv) එම ගිවිසුම් සභාගත කරන්නේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

0505/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය මැතිවරණ කොට්ඨාසයට අයත්, යාංගල්මෝදර නම් ස්ථානයේ දුම්රිය හරස් මාර්ගයක් ඇති බවත්;

(ii) එම ස්ථානයේ මාරක අනතුරු රාශියක් සිදු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) යාංගල්මෝදර දුම්රිය හරස් මාර්ගයේ අනතුරු වැළැක්වීමට හා වාහන තදබදය අවම කිරීම සඳහා ගුවන් පාලමක අවශ්‍යතාවයක් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම ස්ථානයේ ගුවන් පාලමක් ඉදිකිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එම ඉදිකිරීම් ආරම්භ කරන කාලවකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0251/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0455/'10

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කටුනායක හරහා විදේශ ගත වන පුද්ගලයින් සඳහා සුඛෝපභෝගී දුම්රිය සේවාවක් ආරම්භ කොට තිබේද;

(ii) එය ආරම්භ කරන ලද්දේ කවදාද;

(iii) එය ආරම්භ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙළ පැවැත්වීමෙන් පසු එම දුම්රිය සේවාව භාවිතා කොට කොළඹ සිට කටුනායක දක්වා හා කටුනායක සිට කොළඹ දක්වා ගමන් කළ මුළු මගීන් සංඛ්‍යාව කවරේද;

(ii) එහි ආදායම් තත්ත්වය කුමක්ද;

(iii) එහි ප්‍රවේශ පත්‍රයක ගාස්තුව කවරේද;

(iv) එම සේවාව තුල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව කවරේද;

(v) එවන් සේවාවක් වෙනත් ප්‍රදේශ දක්වාද ව්‍යාප්ත කළ හැකිද;

(vi) එසේ එම සේවාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂිත ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0490/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි සිටින රජයේ නියෝජිතයින්ගේ හා එක් එක් සමාගමේ නියෝජිතයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීමට සහ ටෙලිකොම් සමාගම පෞද්ගලීකරණය කිරීමට රජය අදහස් කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර පදනමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩපිළිවෙල කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 73/'10

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු විජයදාස රාජපක්ෂ මහතා,— විදේශ කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,— විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා ජාත්‍යන්තරව මෙරටට ඇති පිළිගැනීම සහ රටේ කීර්තිනාමය ශක්තිමත් කිරීමට සහ ආරක්ෂාකිරීමට අසමත්වීම හේතුකොට ගෙන, අනෙකුත් කරුණු අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව එතුමාට උපදෙස් දීමට විශේෂඥ කමිටුවක් පත්කර ඇති හෙයින් සහ,

(අ) පසුව මතුවන ගැටලු, අඩුපාඩු සහ ඌනතා ඇතිවුවහොත්, එවිට අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගොස් පවසනවා; "පහත දැක්වෙන දේ පිළිබඳව සහයෝගය ලබා ගැනීමට අප කැමැතියි"; යනුවෙන් ඔහු පැවැසූ 2010.05.25 දින එලිසබෙත් ඩිකින්සන් (විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සහකාර කළමනාකරණ සංස්කාරක) සමග ඔහුගේ සම්මුඛ සාකච්ඡාව;

(ආ) එසේ වුව ද, පසුව 2010.05.25 දින 'අයිලන්ඩ්' පුවත්පත වාර්තා කර තිබූ පරිදි "මෙම අවස්ථාවේදී මෙම පියවර (එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරීක්ෂණය) ගනු ලැබීමට නෛතික හෝ සදාචාරාත්මක සාධාරණීකරණයක් නොමැති බව පැවසීම;

(ඇ) අන්තර්ජාතික මානව හිමිකම් උල්ලංඝනය සඳහා වගවීමේ ක්‍රියාදාමයක් පිළිබඳ කිසිදු සඳහනක් කොමිසමේ යොමුකිරීම් අනුදේශවල ඇතුලත්කර නොමැති බව සහ අමාත්‍යවරයා විසින් සඳහන් කළ කොමිසමෙහි වගවීම බැහැරකිරීම, එක්සත් ජාතීන්ගේ සංවිධානයට මැදිහත්වීමට ඉඩ සලසා දෙන බව හොඳින් දැන දැනත්,

26.05.2010 දින නැවතත් "ඩේලි නිව්ස්" පුවත්පතේ වාර්තා කර තිබූ පරිදි ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම හෝ මණ්ඩලයක් වුව පත්කිරීම සඳහා වූ යෝජනාව, කොමිෂන් සභාවේ කටයුතු යළි සිදුකිරීමක් සහ ශ්‍රී ලංකාව තුළ නිශේධනීය දේශපාලන ප්‍රතිචාරයක් ඇති කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන බව පැවැසීම;

(ඈ) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් උපදෙස් දීමට මණ්ඩලයක් පත් කිරීම සඳහා වූ බෑන් කී මූන් මහතාගේ ප්‍රයත්නය වළක්වාලීමට මිත්‍ර රටවල, විශේෂයෙන්ම නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ සාමාජික රටවල සහයෝගය ලබාගැනීමට එතුමා අපොහොසත් වීම;

(ඉ) ශ්‍රී ලංකාවට ජීඑස්පී බදු සහනය අහිමි කිරීමේ තර්ජනය පිළිබඳ ඔහුගේ අධිප්‍රතිචාරය සහ ඒ පිළිබඳ පරස්පර විරෝධි ප්‍රකාශ සිදු කිරීම; සහ

(ඊ) චීනය ආරාධනා කළ අවස්ථාවේ කල් ඉක්මවා එහි රැඳී සිටීමෙන් රට අපකීර්තියට පත් කිරීමට සහ එමගින් සත්කාරක රටේ ආගන්තුක සත්කාරය අනිසිලෙස භාවිතා කිරීම;

යන කරුණු මගින් සාක්ෂි දරන පරිදි එම කරුණු වලට අදාළව ශ්‍රී ලංකා රජයේ සැබෑ ස්ථාවරය සහ ගනු ලැබූ පියවර පිළිබඳ පරස්පර විරෝධී ප්‍රකාශ සිදුකර ඇති හෙයින්,

විදේශ කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතාට ශ්‍රී ලංකා රජයේ අමාත්‍යවරයෙක් ලෙස අඛණ්ඩව කටයුතු කිරීමේ හැකියාව කෙරෙහි මෙම සභාවේ විශ්වාස භංගවී ඇති බවට මෙම සභාව මෙයින් යෝජනා කර සිටියි.

---

## 2010 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0252/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0314/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට රජයේ පාසල් සහ රජයට අනුබද්ධිත පාසල්වල සේවය කරන ඉංග්‍රීසි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මසකට ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) ඔවුන්ට හිමිවන අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ගුරු අවශ්‍යතාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(v) ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය මගහරවා ගැනීම පිණිස ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ඉංග්‍රීසි ගුරුවරුන් 2000 කොරියාවට යැවිය යුතු යැයි එතුමා විසින් යෝජනාවක් හෝ ප්‍රකාශයක් කිරීමට හේතු කවරේද;

(ii) එසේ කිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0363/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ කිහිපය තුළ පාසල් නිල ඇඳුම් සඳහා රෙදි සැපයීමේදී,

(i) "දේශීය වශයෙන් විවීම සහ පිරිසැකසුම් කිරීම"

(iii) "අමුරෙදි ආනයනය කොට දේශීයව පිරිසැකසුම් කිරීම"

යන ක්‍රම දෙක අනුව එය සිදු කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (i) ක්‍රමය යටතේ සැපයූ රෙදි ආනයනය කරන ලද්දේ නිමි රෙදි ආකාරයෙන් බවත්;

(ii) මෙම රෙදි සපයන සමාගම්වලට විශාල ප්‍රමාණයෙන් රෙදි විවීමට හෝ පිරිසැකසුම් කිරීමට අවශ්‍ය ධාරිතාව හෝ සේවක සංඛ්‍යාව නොමැති බවත්;

(iii) කාර්මික සංවර්ධන අමාත්‍යංශයේ 2009.11.24 දිනැති ලිපියට අනුව රෙදි විවීම සඳහා වූ නූල් ආනයනය කිරීම පිළිබඳ ආනයන භාණ්ඩ ලේඛන සහ රේගු ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීමට ඔවුන් අපොහොසත් වී ඇති බවත්;

(iv) දේශීය කර්මාන්තය තිරසාරව පවත්වාගෙන යාමට සහය දීම සඳහා ලබාදුන් ඉහල මිල ඔවුන් අයුතු ප්‍රයෝජන ලබාගැනීමට භාවිතා කර ඇති බවත්;

(v) රජය විසින් මෙම රෙදි සෘජුවම ආනයනය කළේ නම් රජයට බිලියන 1.5ක් ඉතිරිකර ගැනීමට හැකියාව තිබූ අතර එම මුදල අධ්‍යාපනය සඳහා වන වෙනත් වියදම් සඳහා යෙදවීමට හැකියාව තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම කරුණ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් කවුරුන්ද යන්නත්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0364/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සිටින දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔවුන්ට ගෙවිය යුතු වන්දි මුදල් සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ගෙවීම සඳහා රජය විසින් මේ වන විට වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) එයින් මේ වන විට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0443/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගාල්ල, කනම්පිටිය පාර, ජෙමීල් මාවතේ, අංක 97/46 බී දරන නිවසේ පදිංචි එම්. එෆ්. එම්. ගෆූර් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ ආදායම අධි තක්සේරු කොට ප්‍රදේශයේ සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් කරුණු ඉදිරිපත් කිරීම නිසා පසුගිය වකවානුවේ ඔවුන්ට ලබා දී තිබූ සමෘද්ධි සහනාධාර කපා හැර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජීවත්වීමට ස්ථිර ආදායම් මාර්ගයක් හෝ නොමැතිව දිළිඳු භාවයෙන් පෙළෙන රෝගී දරුවෙකු ඇතුළු ගෆූර් මහතාගේ පවුලේ සාමාජිකයන්ට සමෘද්ධි සහනාධාර මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(ii) ගෆූර් මහතා සහ එම පවුලේ සාමාජිකයන්ට නොපමාව සමෘද්ධි සහනාධාර ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0492/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් පානීය ජල පහසුකම් සපයා දී ඇති ප්‍රතිශතය කොපමණද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් පානීය ජල පහසුකම් සපයා දී ඇති ප්‍රතිශතය කොපමණද ;

(iii) මොනරාගල දිස්ත්‍රික්කයට යාබද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් පානීය ජල පහසුකම් සපයා දී ඇති ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ජල පහසුකම් සපයා ඇති ඇතැම් ප්‍රදේශවල ජනතාවට වියළි කාලයේ දී ජලය නොලැබෙන බවත්;

(ii) පානීය ජල අවශ්‍යතා සපුරා නොමැති ප්‍රදේශවල දිළිඳු ජනතාව සීඝ්‍ර ලෙස ලෙඩරෝගවලට ගොදුරු වන බවත්;

(iii) පසුගිය කාලයේ දී අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව මොනරාගල දිස්ත්‍රික්කයේ විශේෂ ජල ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, මොනරාගල දිස්ත්‍රික්කය තුළ දැනට ජල පහසුකම් නොමැති ප්‍රදේශවලට ජලය ලබාදීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0493/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වයඹ පළාතේ විශාලතම පළාත් පාලන ආයතනය අලව්ව ප්‍රාදේශීය සභාව බව එතුමා දන්නෙහිද?

(ආ) එහි ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන කොපමණද?

(ඇ) නාරම්මල ප්‍රාදේශීය සභාව ලෙස නව පළාත් පාලන ආයතනයක් පිහිටුවීමට ඉල්ලීමක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මේ වන විට එම යෝජනාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) එම යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0337/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලි බල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ, වැකඳවල, දිඹුල්ගොඩ ගම්මානයේ පවුල් 150 ට ආසන්න ජනතාවක් ජීවත්වන බවත්;

(ii) එම ගමේ අංක 70 ලිපිනයේ පදිංචි කේ. කේ. කිරිගෝරිස් මහතාගේ නිවසට සහ තවත් එක් නිවසකට යන මාර්ගයේ හැර අනෙකුත් මාර්ගවල විදුලි රැහැන් ඇද ඇති බවත්;

(iii) එම නිවාස දෙක සඳහා විදුලිය ලබා දීමට කණු 4ක දුර ප්‍රමාණයකට විදුලි රැහැන් ඇදීමට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට ක්‍රියාත්මක වන රන්එළිවැට ව්‍යාපෘතිය යටතේ මෙම නිවාස 2ක සඳහා විදුලිය ලබාගැනීමට අවශ්‍ය විදුලි රැහැන් ඇදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0439/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුලියන්කුලම ගුවන් හමුදා කඳවුරේ සේවය කරමින් සිටි ගුවන් භට II-TA 26125, ආර්. එම්. එන්. එස්. රත්නායක භටයා මේ වන විට රෝගීවී සිටින්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඔහු පලිගැනීමක් පදනම්කර ගත් පහරකෑමකට ලක්ව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔහු බොක්සින් ක්‍රීඩාවේ සිටිය දී මෙම අනතුර සිදුවී නම්, ඔහු සමඟ ක්‍රීඩා කළ අනෙක් ක්‍රීඩකයාගේ බර පන්තිය කුමක්ද;

(ii) ඔහු සමඟ ක්‍රීඩා කළ ප්‍රතිවාදියා ඔහුගේ බර පන්තියට සමාන අයෙක් ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රෝගී වූ භටයෙකු වෙනුවෙන් ගුවන් හමුදාවෙන් ලබා දෙන වරප්‍රසාද රත්නායක මහතාට ලබා දෙන්නේද;

(ii) රෝගී වන විට ඔහුගේ වයස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0459/'10

ගරු රවී කරුණානායක මහතා,— නැවත පදිංචි කරවීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අද දිනය වන විටත් කඳවුරු තුල සිටින අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන්ගේ මුළු සංඛ්‍යාව කවරේද;

(ii) නැවත පදිංචි කරවන ලද අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව කවරේද;

(iii) එක් පවුලක් වෙනුවෙන් ගෙවනු ලබන මුදල කොපමණද;

(iv) මේ වනවිට ඔවුන් ජීවත්වීමට අවශ්‍ය ආදායම උපයා ගන්නා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පළවූ වාර්තාවන්ට අනුව, යුධ ජයග්‍රහණයේ අවසන් කාලසීමාව තුල රත්‍රන් විශාල ප්‍රමාණයක් හමුවූ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ හමුවූ රත්‍රන් ප්‍රමාණයේ බර කිලෝ ග්‍රෑම් කොපමණද;

(ii) මේ වනවිට එම රත්‍රන්වලට කුමක් සිදුවී තිබේද;

(iii) ඒවායේ ආරක්ෂාව භාරව සිටින පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) එම රත්‍රන් භාණ්ඩ නැවත කිසියම් පවුලක් වෙත භාරදී තිබේද;

(v) එසේ නම්, ඒ අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0563/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේදී රජයට පවරාගැනීමට නියමිතව තිබූ වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ දක්වා රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) එළෙස පවරා ගන්නා ලද එක් එක් රෝහලේ සිදු කරන ලද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් කවරේද;

(iv) ඉහත කී රෝහල් සඳහා බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය කවරේද;

(v) එකී රෝහල්වල වත්මන් කාර්ය මණ්ඩලය, නව සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරගැනීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0339/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ද/රණකෙළිය ග්‍රාම නිලධාරී වසමේ, තිස්සමහාරාම යෝධකණ්ඩිය ද/රණකෙළිය ලිපිනයේ පදිංචි ඩබ්. එම්. සොම්පාල මහතා ජනසවිලාභියෙක් වශයෙන් ලියාපදිංචිව සිට පසුව වර්ෂ 2001 දී අංක H-T-15-85 යටතේ සමෘද්ධිලාභියෙක් වශයෙන් රු. 375ක සමෘද්ධි දීමනාවක් ලබා ගත් අයෙකු බවත්;

(ii) මොහු ජනසවි නිවසක ස්ථිර පදිංචිකරුවෙකු බවත්;

(iii) බිරිඳ සහ දරුවන් 7 දෙනෙකුගෙන් යුතු ඔහුගේ පවුල පෝෂණය කරනුයේ හදිසියේ ලැබෙන කුලී වැඩ කිරීමෙන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2001 වර්ෂයේදී සමෘද්ධි රැස්වීමට නොපැමිණීම හේතුවෙන් ගෙවීමට නියමවූ දඩ මුදල වන රු. 100 ගෙවීමට නොහැකිවීම නිසා මොහුගේ සමෘද්ධි මුද්දරය අවලංගු කළ බවත්;

(ii) එම නිසා එදින සිට මේ දක්වා සමෘද්ධිලාභීන්ට රජයෙන් ලැබෙන වරප්‍රසාද මොහුට අහිමිව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේ සිට මොහුගේ සමෘද්ධි මුද්දරය නැවත වලංගු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0472/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට "හෙජින්" ගනුදෙනු ක්‍රමය හඳුන්වාදුන්නේ කවරෙක්ද;

(ii) එම ගනුදෙනුව ඉදිරිපත් කිරීමේ අරමුණ කුමක්ද;

(iii) ඒ සඳහා කිසියම් ටෙන්ඩර් කැඳවීමක් කරන ලද්දේද;

(iv) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අයගේ නම් කවරේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා, හෙජින් ගනුදෙනු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) මෙම ගනුදෙනුවට විරුද්ධව මහජනයා විසින් පවරන ලද නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි නඩු පැවරූ අයගේ නම් සහ එම නඩු පැවරූ දිනයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රතිඵලය කවරක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අභ්‍යන්තර සමථකරණයක් සඳහා කිසියම් බැංකුවක් විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තෝරාගෙන තිබේද;

(ii) එසේ තෝරාගෙන තිබේ නම්, ඒ කොපමණ මුදලකටද සහ එය සිදුකළ ස්ථානය කවරේද;

(iii) සිදු කරන ලද නීතිමය කටයුතු වෙනුවෙන් මේ දක්වා ගෙවීමට තිබෙන මුළු මුදල කොපමණද;

(iv) නීතිමය කටයුතු සඳහා වියදම් ලෙස ගෙවීමට නියමිත මුදල කොපමණද;

(v) ඉහත නඩු සඳහා සම්භව්‍ය වගකීම් වටිනාකම කොපමණද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0491/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තුළ සිටින රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණ ද;

(ii) ලබා ඇති උපාධිය අනුව එක් එක් අංශය යටතේ රැකියා විරහිත සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඔවුන්ට රැකියා ලබා දීම සඳහා නව වැඩ පිළිවෙළක් රජය විසින් දියත් කරන්නේද;

(ii) නොඑසේ නම්, දැනට රජය සතු රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළ මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0564/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුස්සැල්ලාව ප්‍රොටොෆ් (Protoft) වතුයායේ පිහිටා ඇති වතුරෝහල 2009 වසරේදී රජයට පවරා ගත් බවත්;

(ii) වසරකට ඉහත එහි නව ගොඩනැගිල්ලක් ඉදිකොට වැඩ නිම කළ බවත්;

(iii) එම ගොඩනැගිල්ල වසා දමා තිබෙන බව සහ එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල විවෘත කොට එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය විවෘත කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 69/'10

ගරු රවි කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුවක් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලබා දී එම දරුවන් වඩාත් විධිමත් ආකාරයෙන් රැකියා අවස්ථාවලට යොමු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 ඔක්තෝබර් මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0334/'10

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් පළාත් සභාවේ සමස්ත වාර්ෂික වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරමින් මෙම එක් එක් පළාත් සභාවට තෝරා පත් කරගෙන ඇති, වත්මන් මන්ත්‍රීවරුන්ගේ නම්, උපන්දිනයන් සහ දේශපාලන පක්ෂ කවරේද;

(ii) පළාත් සභා මන්ත්‍රීවරයකුට හිමි ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0407/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, ගොඩකවෙල නගරය තුළ ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇති ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ජල යෝජනා ක්‍රමය මගින් ජලය ලබා දෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් පානීය ජලය සපයන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ජල යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) එම ජල යෝජනා ක්‍රමය අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0441/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ භටයින්ට දැනට ගෙවනු ලබන්නේ විශ්‍රාම වැටුපෙන් 65% ක් බවත්;

(ii) මහින්ද චින්තන වැඩ සටහන අනුව එය 85% තෙක් ඉහළ නැංවිය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහින්ද චින්තනය වැඩ සටහන අනුව සිදු කළ යුතු එම ඉහළ නැංවීම මේ වන තෙක් ක්‍රියාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම් එය ක්‍රියාත්මක කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ ) නොඑසේ නම්, ඒ මන්ද?

0542/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතීව් රෝහලට අයත් ගිලන්රථය පසුගිය දා නාඳුනන පිරිසක් විසින් ගිණි තබා විනාශ කළ බවත්;

(ii) එම නිසා රෝහලේ අසාධ්‍ය රෝගීන් සහ ගර්භණී මව්වරුන් හදිසි ප්‍රතිකාර සඳහා වෙනත් රෝහලකට රැගෙන යෑමේ අපහසුතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කාරතිව් රෝහලට ගිලන්රථයක් ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳව අම්පාර දිස්ත්‍රික් සංවර්ධන සහ සම්බන්ධීකරණ කමිටුව මඟින් අදාළ බලධාරීන් දැනුවත් කර තිබුණත් මේ දක්වා ගිලන්රථයක් ලබා දීමට පියවර ගෙන නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම රෝහලට නොපමාව ගිලන්රථයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත්කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට

(අ) (i) ස.තො. ස. ආයතනයේ සිල්ලර ගබඩා පැය 24 පුරා විවෘතව තැබූ කාල සීමාවේදී එම ආයතනය භාරව කටයුතු කළ අමාත්‍යවරයා කවරෙක්ද;

(ii) එම අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති ලේකම්ගේ අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු නාමයන් කවරේද;

(iii) එම තනතුරු හෙබවූ නිලධාරීන්ගේ නම්, ලිපිනයන්, ලැබූ වැටුප් හා දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍යවරයා අමාත්‍ය පදවිය දැරූ කාල සීමාවේදී ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් හා ස.තො.ස වැනි අනුබද්ධ සමාගම්වලින් අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දැරූ තනතුරු, වැටුප්, දීමනා සහ ලැබූ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට පෙර සේවය කළ ආයතන හා දැරූ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0603/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007, 2008 සහ 2009 වර්ෂවලදී;

(i) කොළඹ වරායට පැමිණි නැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොළඹ වරාය වාර්ෂිකව මෙහෙයවන ලද භාණ්ඩ බහාලුම් ප්‍රමාණය කොපමණද;

(iii) කොළඹ වරාය ඉපැයූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) ඉදිරි වර්ෂවලදී කොළඹ වරායේ ඉපැයුම් වර්ධනය කිරීම සඳහා යෝජිත වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0604/'10

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දිවයින පුරා සිටින කිරි ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 හා 2009 වර්ෂයන්හිදී දේශීය කිරි නිෂ්පාදනය ලීටර් මිලියන කොපමණද;

(iii) එම කිරි නිෂ්පාදිතයන් ඉහත එක් එක් වර්ෂයේ ජාතික කිරි අවශ්‍යතාවයට දායක වූ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කවරේද?

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කිරි ගොවීන් ආර්ථිකමය වශයෙන් සවි බල ගැන්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) කිරි කර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) වතුකරයේ කිරි ගොවීන්ගේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ සැළසුමක් පවතින්නේද;

(iv) එසේ නම්, ඒ කවරේද?

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන්

වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද සහ ඔවුන් කවර ප්‍රදේශ වලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0412/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, වොක්ෂෝල් වීදියේ, අංක 175 සී කොටසෙහි පිහිටි වර්ග අඩි 2,227කින් යුත් ගබඩාව, කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ අංක 345, දරන ලිපිනයැති ග්ලෝබල් ටී බැගස් සමාගමට, මාසික කුළිය රු. 30,065/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) බදුකරු විසින් අදාළ ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත ගබඩාව නැවත ජ.න.ව.ස.ම. වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වගකිව යුත්තේ කවරහුද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0442/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය දිනවලදී පොසීඩන් ලීඩර් (Poseidon Leader) නෞකාව මගින් මෙරටට ගෙන එන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නෞකාව අයත් සමාගමේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නෞකාව මඟින් ගෙන්වන ලද වාහනවල වර්ගයන්හි නම් වෙන් වෙන් කවරේද;

(ii) එම වාහන පාවිච්චි කරන ලද (Recondition) ඒවාද නැතහොත් පාවිච්චි නොකළ අලුත්ම තත්වයේ (Brand new) වාහන ද;

(iii) එක් එක් වාහනයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවටද ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම වාහන නැව්ගත කර ඇති දිනය කවදාද;

(ii) ඒවා අයත් සමාගම්වල නම් කවරේද;

(iii) එම වාහන මෙරටට ගෙන්වන ලද අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0544/10

ගරු එම්.ටී. හසන් අලි මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරනු ලබන නිල හැඳුනුම්පත් හිමි වයෝවෘද්ධ පුද්ගලයන් සඳහා ලබා දී ඇති වරප්‍රසාද සහ සහන කවරේද;

(ii) එකී හැඳුනුම්පතක් හිමි අඩු ආදායම්ලාභී පවුලක වයෝවෘද්ධ පුද්ගලයෙකුට මාස්පතා යම් මූල්‍යාධාරයක් ලබාදීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(iii) මහින්ද චින්තන ප්‍රතිපත්ති අනුව ඉහත හැඳුනුම්පත්ලාභී වයෝවෘද්ධ අයෙකුට ලබා දෙන වරප්‍රසාද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල හැඳුනුම්පත් ලබා දී ඇති අයට ලබා දෙන වරප්‍රසාද, පහසුකම් හා සහනදායි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කර ඇති චක්‍ර ලේඛයන් කවරේද;

(ii) එම චක්‍රලේඛයන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන කවරේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0413/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ, අංක 175 F කොටසෙහි පිහිටි වර්ග අඩි 5079කින් යුත් ගබඩාව, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ පිහිටි සමර්විල් කම්පැනි නම් වූ සමාගමට, මාසික කුළිය රු. 66,027/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් අදාළ බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) මෙම බදු ගෙවීමේදී නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වගකිව යුත්තෝ කවරහුද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0458/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට ක්‍රියාත්මක වන මුළු ගැන්ට්‍රි දොඹකර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ කොපමණ කලකට ඉහත ද;

(iii) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් පැයකදී සිදු කරන ලද බහළු මෙහෙයුම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සිංගප්පූරුව, හොංකොං, ඩුබායි, මැලේසියාව සහ ඉන්දියාවේ මුම්බායි සහ චෙන්නායි වරායවල් සමග සැසඳීමේදී මෙහි තත්ත්වය කුමක්ද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී සහ එක් එක් මාසයේදී කොළඹ වරාය විසින් මෙහෙයවන ලද බහළු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) බහළු මෙහෙයවීම සඳහා ගැන්ට්‍රි දොඹකර අටක් මිලදී ගැනීම සඳහා කොළඹ වරාය විසින් මුදල් ආයෝජනය කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙහි සමස්ත පිරිවැය කොපමණද;

(ii) ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ආදායම වර්ධනය කරන ආකාරය කවරේද;

(v) ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානයේ කරන ගෙවීම් දක්වා සියල්ල ඇතුලත් සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මෙම අනවශ්‍ය සහ අවාසිදායක ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ලබාගත් තරඟකාරී මිල ගණන් සමග සන්සන්දනය කිරීමෙන් අනතුරුව ඉහත ව්‍යාපෘතිය ඇරඹීම සාධාරණීකරණය කිරීම සඳහා කරුණුද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0460/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට ඇති බන්ධනාගාර නියාමක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද:

(ii) එම පුරප්පාඩු පවතින බන්ධනාගාර කවරේද;

(iii) රජය එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන්නේ ද;

(iv) එසේ නම්, ඒ කුමන පදනමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය රජය විසින් බඳවාගන්නා ලද බන්ධනාගාර නියාමකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 ඔක්තෝබර් මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0269/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1990 සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී කොළඹ වරාය විසින් මෙහෙයවන ලද;

(i) බහළු ප්‍රමාණය කොපමණද;

(ii) සාමාන්‍ය නැව් බඩු හෝ බහළුගත නොකළ නැව් බඩු ටොන් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දකුණු ආසියා පිවිසුම් මාර්ග ගිවිසුම අත්සන් කළ දිනය සහ එහි මෙහෙයුම් ආරම්භ වූ දිනය කවරේද;

(ii) ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි කවරේද;

(iii) අදාළ පාර්ශ්වයන් මෙම කොන්දේසි ඉටු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු ආසියා පිවිසුම් මාර්ග මෙහෙයුම්වලට පෙර සහ ඊට පසු අද දක්වා වූ පසුගිය වර්ෂ 15 තුළ එළිසබෙත් රැජිණ තටාකයේ බහළු සහ සාමාන්‍ය නැව් බඩු මෙහෙයවීමේ කාර්ය සාධනය කවරේද;

(ii) එළිසබෙත් රැජිණ තටාකය ලැබූ ආදායම සහ පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේ ලැබූ ශුද්ධ ලාභය කොපමණද;

(iii) දකුණු ආසියා පිවිසුම් මාර්ගය සඳහා ලබාදුන් බදු සහන කවරේද;

(iv) බදු විරාමය ලබා දීමෙන් සිදුවූ ආවස්ථික අලාභය කොපමණද; සහ

(v) එසේ කිරීමෙන් ලැබූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය කොපමණද;

යන්නත් එතුමා සඳහනන් කරන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

0373/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 1990 ඔක්තෝබර් මස 31 වැනි දිනය වන විට උතුරු පළාතේ යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවල මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ එම වකුෆ් අංශයේ ලියා පදිංචි වී තිබූ;

(i) මුස්ලිම් පල්ලි, ජුම්ආ පල්ලි, තක්කියා, සාවියා, ධර්ගා යන මුස්ලිම් ආගමික පුණ්‍යායතනවල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම්, ලිපිනයන් සහ ලියාපදංචි අංක කවරේද:

(iii) මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවල නීත්‍යානුකූල භාරකරුවන් වශයෙන් ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයෙන් හෝ මුස්ලිම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් එවකට පත්කරනු ලැබ සිටි තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවලට අයත්, යැයි කියන (1956 අංක 51 දරණ මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත යටතේ ලියාපදිංචි කොට ඇති) නිශ්චල දේපල කවරේද;

(v) එම වකුගඩු දේපල පිහිටි ස්ථානයේ වරිපනම් අංක සහ ලිපියනයන් කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

0397/'10

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ 2009 වර්ෂයේදී වාර්තාගත වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය ඉන් පෙර වර්ෂය හා සැසඳීමේදී රෝගීන් සංඛ්‍යාවේ වැඩිවීමක් ද; නැතහොත් අඩුවීමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජරට ප්‍රදේශයේ ව්‍යාප්ත වකුගඩු රෝගය සඳහා හේතු වූ සාධක හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) අදාළ හේතු සාධක ප්‍රදේශයෙන් ඉවත් කිරීම සඳහා යෝජිත හෝ ක්‍රියාත්මක වැඩපිළිවෙලක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0405/’10

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්පකුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ මුළු ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින්, මෙතෙක් මියගිය රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රුධිර පාරවිලයනය මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මත්ද්‍රව්‍ය එන්නත් කිරීම මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝගී මවගෙන් රෝගය වැලඳුනු දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2007, 2008 හා 2009 වර්ෂ වල ඒඩ්ස් රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා දරන ලද මුළු වියදම මුදලින් කොපමණද;

(ii) ඒඩ්ස් රෝග ව්‍යාප්තිය මර්ධනය සඳහා දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0414/’10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර, මැද දුම්බර පිහිටි හෙයාර්ෆාක්වත්තේ හෙක්ටයාර් 976.75ක භූමි භාගය කැළණිය, වනවාසල පුනස්ථා ග්‍රීන් ගාඩන්ස් සමාගමේ අධ්‍යක්ෂ මංජුල ගුණවර්ධන යන අය වෙත රු. මිලියන 2ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?;

(ආ) (i) අදාළ ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු බදු ගිවිසුමට අනුව කටයුතු කර තිබේ ද;

(iii) එසේ නොමැති නම්, ඊට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) බදුකරු නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, අදාළ බදු ගිවිසුම අවලංගු කර ඉඩම නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නෙහිද;

(v) එසේ නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳ වග කිවයුත්තෝ කවරහුද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0468/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර අංශයේ නායකයා ලෙස හඳුන්වනු ලැබූ කුමරන් පද්මනාදන් නැමැති අය අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට රැගෙන ආ දිනය කවරේද;

(ii) ඔහුට විරුද්ධව චෝදනා ගොනුකොට තිබේද;

(iii) එසේ නම්, ඒ කුමන අධිකරණයකද;

(iv) ඔහු දැනට රඳවාගෙන සිටින්නේ බන්ධනාගාරයකද; නැතහොත් වෙනත් ස්ථානයකද;

(v) බන්ධනාගාරයක නම් එහි නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔහු පසුගිය දිනක වන්නි ප්‍රදේශයේ සංචාරයකට රැගෙන ගොස් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0605/’10

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑම් පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට අයත් විමර්ශන කටයුතු සඳහා වැය කර ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංවිධානය නායයෑම් පිළිබඳව රාජ්‍ය අංශයේ විමර්ශන කටයුතු සඳහා මූල්‍යමය අය කිරීමක් සිදු කරන්නේද;

(iii) 2009 වර්ෂයේ නායයෑම් පිළිබඳව පෞද්ගලික අංශයේ විමර්ශන කටයුතු සිදු කිරීම මගින් එම සංවිධානය ඉපැයූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නායයෑම්වලින් සිදුවන හානිය අවම කිරීම සඳහා ආපදා කළාප පිළිබඳව දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0606/'10

ගරු හේමාල් ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේ මෙරට කුරුඳු වගා කරන ලද හෙක්ටයාර සංඛ්‍යාව කොපමණද;

(ii) 2007, 2008 සහ 2009 වර්ෂවලදී අපනයනය කරන ලද කුරුඳු මෙට්‍රික්ටොන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් වර්ෂයේ කුරුඳු අපනයනයෙන් ඉපැයූ ආදායම කොපමණද;

(iv) 2009 වර්ෂයේ දේශීය කුරුඳු අපනයනය ලෝක වෙළඳපොළේ කුරුඳු ඉල්ලුමෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙරට කුරුඳු නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිති සහතික ලබාගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු කුරුඳු නිෂ්පාදනය සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0415/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ වොක්ෂෝල් වීදියේ, අංක 175 ඒ කොටසෙහි වර්ග අඩි 5,000 ක ගබඩාව, කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 139 හි පිහිටි සමර්විල් කම්පැනි නම් වූ සමාගමට මාසික කුළිය රු. 67,500 ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0446/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අමාත්‍යාංශ වෙත පැවරී ඇති බලතල, රාජකාරී සහ කාර්යයන් පිළිබඳ ගැසට් පත්‍රය 2010 අප්‍රේල් 30 දින ප්‍රකාශයට පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම බලතල, රාජකාරී සහ කාර්යයන් ඉන්පසුව වෙනස් කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එසේ නම්,

(i) බලතල, රාජකාරී සහ කාර්යයන් අඩු කරනු ලැබූ අමාත්‍යාංශ කවරේද;

(ii) එම බලතල පවරන ලද්දේ කා හටද;

(iii) එම වෙනස්කම් සිදුකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට අමාත්‍යාංශ සතු සියලු බලතල, රාජකාරී සහ කාර්යයන් සඳහන් සම්පූර්ණ ලැයිස්තුවක් එතුමා ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0469/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර අංශයේ නායකයා ලෙස හඳුන්වනු ලබන කුමරන් පද්මනාදන් නැමැති අය විසින් පාලනය කරන ලද එල්.ටී.ටී.ඊ.යට අයත් ජාත්‍යන්තර වත්කම් රජය විසින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම වත්කම්වලින් දැනට ශ්‍රී ලංකා රජය විසින් රාජසන්තක කොට තිබෙන වත්කම් මොනවාද;

(iv) එසේ රාජසන්තක නොකොට තිබෙන වත්කම් මොනවාද;

(v) එම වත්කම් තිබෙන බවට දැනට සොයාගෙන තිබෙන රටවල් මොනවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/'10

ගරු මොහාන් ප්‍රියදර්ශණ ද සිල්වා මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 හා 2009 වර්ෂවලදී දේශීය වෛද්‍ය අවශ්‍යතාවය අනුව මෙරටට ආනයනය කරන ලද ඖෂධ පැළෑටි වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ පැළෑටි ආනයනය සඳහා ඉහත වර්ෂවලදී දැරූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ පැළෑටි මෙරට වගා කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් තිබේද;

(ii) එසේ නම්, අදාල ව්‍යපෘති සඳහා මේවන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0416/'10

ගරු ටී. රංජිත්ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ,

(i) ඇති කුඩා තේ වතු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) සිටින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) නියඟය නිසා විනාශ වූ කුඩා තේ වතු බිම් ප්‍රමාණය කොපමණද;

(iv) නියඟය නිසා පීඩා විඳින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මේ වන විට නියඟයෙන් හානි වූ තේ වතු

නඟා සිටුවීමට කටයුතු සම්පාදනය කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියා මාර්ග කවරේද;

(iii) නියඟයෙන් කුඩා තේ වතු හිමියන්ට වූ හානිය අවම කිරීමට නැවත වගාව සඳහා සහනාධාර ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0456/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ නගරය තුළ තිබූ පදික වෙළෙඳුන් සතු සියලුම වෙළෙඳසැල් කඩා දැමීමේ වැඩ පිළිවෙළක් රජය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒවා ඉවත් කරන ලද දිනය සහ ඒවා ඉවත් කළේ කුමන හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සියලුම වෙළෙඳසැල් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒවා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) තවමත් වෙළෙඳසැල් පවත්වාගෙන යන පදික වෙළෙඳුන් සිටින්නේ නම් එම වෙළඳාම නීත්‍යානුකූල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉවත් කරන ලද පදික වෙළෙඳුන් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දී තිබේද;

(iii) ඔවුන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති විකල්ප ස්ථාන කවරේද;

(iv) කොළඹ නගරය හැර වෙනත් ප්‍රදේශවලත් මෙම ගැටළුව පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) දේශපාලන පළිගැනීමක් සඳහා මෙය සිදුකල බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0470/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ඇසීමට,—

(අ) (i) එල්.ටී.ටී.ඊ. ය සමග කළ අවසන් සටනේදී රජයේ හමුදාවන් විසින් එල්.ටී.ටී.ඊ. ය සතුව තිබී අත්අඩංගුවට රත්තරන් කිලෝ ප්‍රමාණය කොපමණද?

(ii) එම රත්තරන් තොගය සොයාගත් හමුදා නිලධාරීන් කවුරුන්ද;

(iii) එම රත්තරන් තොගය බාරදී ඇති උසාවිය හෝ ස්ථානය කුමක්ද;

(iv) එම රත්තරන් තොගයේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0305/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිධූරය යම් පුද්ගලයෙකුට හෙබවිය හැකි වාර ගණන කොපමණද;

(ii) එම වාර ගණන වැඩි කිරීම සඳහා රජය කටයුතු කිරීමට අදහසක් තිබේද;

(iii) එසේ නම්, ඒ කී වරක් දක්වාද;

(iv) එසේ වාර ගණන වැඩි නොකරන්නේ නම්, විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට රජය අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0377/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැත්වූ අයිෆා සිනමා සම්මාන උළෙල සංවිධානය කළ රට කුමක්ද;

(ii) ඒ සඳහා ඉල්ලුම් කළ අනෙකුත් රටවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාව සහ අයිෆා අතර අත්සන් කළ ගිවිසුම කවරේද;

(iv) එම ගිවිසුම අත්සන් කළ පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) අයිෆා සම්මාන උළෙල නිසා ශ්‍රී ලංකාවට දැරීමට සිදුවූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයිෆා සම්මාන උළෙලේ ප්‍රවේශ පත්‍රවල විකිණුම් මිල කොපමණද;

(ii) මේ සඳහා නිකුත් කරනු ලැබූ රුපියල් මිලියනයක වටිනාකම ඇති විශේෂ අනුග්‍රහ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ෂා රුක් ඛාන්, අමිතාභ් බච්චන් (වෙළෙඳ නාම තානාපති) සහ අයිශ්වර්යා රායි වැනි ප්‍රසිද්ධ නළු නිළියන් ශ්‍රී ලංකාවට පැමිණ මෙම උත්සවයට සහභාගී නොවීමට හේතුව කවරේද;

(ii) මෙම ප්‍රසිද්ධ නළු නිළියන් නොපැමිණීම නිසා 2010 ජූනි 03 වැනි දින වනවිට අවලංගු කරන ලද හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0417/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, වොක්ෂෝල් වීදියේ, අංක 175 හි පිහිටි වර්ග අඩි 5000කින් යුත් ගබඩාව, කොළඹ 10 ටී. බී. ජයා මාවතේ අංක 338 හි පිහිටි ඇරිනා

ඉන්ටර්නැෂනල් සමාගමට මාසික කුළිය රු. 108,000/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ඔප්පුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය හා රජයේ තක්සේරු වාර්තාව ලබාගෙන තිබේද;

(ii) බදුකරු විසින් බදු ගිවිසුමට අනුව හා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද; නැතහොත් කටයුතු කරගෙන යන්නේද;

(iii) එසේ නොමැති නම්, අදාළ ගබඩාව නැවත ජ.න.ව.ස.ම. ට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව කටයුතුකර නොමැතිනම්, ඒ පිළිබඳව වගකිවයුත්තෝ කවරහුද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0516/'10

ගරු රෝසි සේනානායක මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාව තුළ දිනකට නිෂ්පාදනය කෙරෙන එළකිරි ප්‍රමාණය; ගොවීන්ගෙන් කිරි එකතු කරන මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ කිරි ලීටරයක් සඳහා ගොවීන්ට ගෙවන මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දේශීය එළකිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0610/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය අවසානය වන විට බන්ධනාගාරගත මව්වරුන් සමග සිටි දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මව හා දරුවා යන දෙදෙනාම රැඳවියන් ලෙස බන්ධනාගාරගත වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂය අවසාන වන විට වයස අවු. 22ට අඩු බන්ධනාගාරගත සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරුණ වැරදිකරුවන් සාමාන්‍ය සිරකරුවන්ගෙන් වෙන්කර තැබීම සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0327/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සහ 2009 වර්ෂයන් තුළ, ශ්‍රී ලංකා රේගුව මගින් අත්අඩංගුවට ගන්නා ලද නීත්‍යානුකූල නොවන බඩු භාණ්ඩ වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත ලබාදී

ඇති ත්‍යාග සහ දීමනාවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) එම ත්‍යාග සහ දීමනා ලබා ගත් නිලධාරීන් කවුරුන්ද;

(iii) අදාළ නිලධාරීන් වෙත ත්‍යාග සහ දීමනා ලබාදීමට හේතු වූ සිද්ධීන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් වෙත ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0418/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ, අංක 175 ඒ කොටසෙහි පිහිටි වර්ග අඩි 760කින් යුත් ගබඩාව මඩුල්දෙණිය, බටගොල්ලවත්ත ලිපිනයේ පදිංචි ශාන්ත ජයසිංහ යන අයට මාසික කුළිය රු. 10,260/-ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව ක්‍රියාකර නොමැති නම්, ඒ පිළිබඳව වගකිවයුත්තේ කවරහුද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0429/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන පිහිටුවා ඇති දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) අනෙකුත් නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ උපන්දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතියෙන් ස්ථාපිත කර ඇති එබඳු ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් ආයතනය සඳහා රජය මඟින් ප්‍රදානය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා ආඥාපනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා සංශෝධන පනත මගින් (අ) (i) හි සඳහන් ආයතන එම ආයතන, වල ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට නියම කර තිබේද;

(ii) එබඳු ආයතනවල ගිණුම් සහ ක්‍රිකට් මණ්ඩලයේ මධ්‍යම ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(iii) පසුගිය වසර 5 සඳහා ක්‍රිකට් මණ්ඩලයේ ගිණුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/'10

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාවේ පෝෂණ ඌනතා ඇති දරුවන් සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දැනට සිටින අවුරුදු 5ට අඩු මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සිටින මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දරුවන්ගේ පෝෂණය නැංවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන වැඩසටහන් කවරේද;

(ii) එම වැඩසටහන් යටතේ සිටින ප්‍රතිලාභීන් ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0611/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වසර අවසානවන විට දඬුවම් නියම වූ සහ සැකකරුවන් වශයෙන් බන්ධනාගාරගත වී සිටි මුළු රැඳවියන් ගණන කොපමණද;

(ii) බන්ධනාගාර තුළ දැනට පවතින ඉඩ ප්‍රමාණවත් වන මුළු රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාර තුළ පවතින තදබදය අවම කිරීමට නව බන්ධනාගාර පිහිටුවීම සඳහා යෝජිත වැඩපිළිවෙලක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0419/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, කොළඹ 10, ඩාර්ලි පාරේ, අංක 320 ස්ථානයේ පිහිටි වර්ග අඩි 12,845ක ගබඩාව, මහනුවර විලියම් ගොපල්ලව මාවතේ, මැග්කා කෙයාර් සෙන්ටර් සමාගම වෙත මාසික කුළිය රු. 199,418.63/-ක මුදලකට බදු දී ඇති බව, එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) නීත්‍යානුකූලව බදු දී නොමැති නම්, ඒ පිළිබඳව වගකිවයුත්තෝ කවරහුද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0430/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එක් එක් ආයතනය සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සඳහන් කරමින්, රජයට අයත් සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වසර තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වසර සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0484/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම සිට මන්නාරම දක්වා ප්‍රදේශයේ සුළං බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස්කොට තිබේද;

(ii) එසේ නම්, ඇස්තමේන්තු අනුව එම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එයින් ජනනය කිරීමට අපේක්ෂිත විදුලිය ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ඉල්ලුම්කරුවන් කිසිවකු සිටින්නේද;

(ii) එසේ නම්, එම ආයතන හා ඒවා අයත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0518/'10

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ගැබිනි මව්වරුන් සහ කිරිදෙන මව්වරු අතරින් යකඩ ඌණතාවයෙන් පෙලෙන සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ පෝෂණය නැංවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අඩු බර දරු උපත් සංඛ්‍යාව කොපමණද;

(iv) අවු. 5ට අඩු දරුවන් අතරින් යකඩ ඌණතාවයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උතුරු නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් ඉහත (අ) (i), (ii), (iv)ට අදාළ සංඛ්‍යා ලේඛන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0612/’10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ නිසා බන්ධනාගාරගතවූවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය එම වසර තුල බන්ධනාගාරගත වූ මුළු සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ නිසා සිරගතවූවන් සඳහා වෙනම බන්ධනාගාර පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0260/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0273/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප්" නමැති සංවිධානයක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සංවිධානයේ නියෝජිතයින් දැනට ශ්‍රී ලංකාව තුළ සිටිත් ද, එසේත් නැති නම්, පසු ගිය වර්ෂ 10ක කාලය තුළ සිටියෝ ද;

(ii) එම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ කවර විධිවිධාන යටතේද;

(iii) එහි ජාත්‍යන්තර ක්‍රියාකාරිකයින් සඳහා වීසා බලපත් ලබා දුන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුළ සේවයේ යොදවනු ලැබූ ශ්‍රී ලාංකිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සතු අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් කවරේද;

(iii) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප්" සංවිධානය විසින් ඒ එක් එක් තැනැත්තාට ගෙවන ලද මුදල සහ ඒවා ගෙවූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම සංවිධානය හෝ එහි සේවකයින්ගෙන් කිසිවකු ශ්‍රී ලංකාවේදී බදු ගෙවිය යුතුව තිබේද;

(ii) එසේ නම්, ඔවුන් එම වගකීම ඉටු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(ii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0366/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් අනුව වෛද්‍යවරුන් සහ ජනතාව අතර පැවතිය යුතු අවම අනුපාතය කුමක්ද;

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගන්නා ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සහ ජනතාව අතර තිබිය යුතු අවම අනුපාතය කොපමණද;

(iii) දැනට ශ්‍රී ලංකාව තුළ පවතින වෛද්‍යවරුන් සහ ජනතාව අතර අනුපාතය කොපමණද;

(iv) මධ්‍යම රජයේ පාලනය යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) පළාත් සභා යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් පිටවන වෛද්‍යවරුන් රජයේ සේවයට බඳවා ගැනීම නතර කිරීමට හෝ සීමා කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 6 ක කාලය තුළ රෝහල්වලින් ඉවත් කළ බාල වර්ගයේ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද ඖෂධවල වටිනාකම කොපමණද;

(iii) එම ඖෂධ ගෙන්වීමට අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(iv) එම ඖෂධ විනාශ කිරීමට රජය විසින් මුදලක් වැය කළේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) බාල වර්ගයේ ඖෂධ ගෙන්වීමෙන් සමස්තයක් ලෙස රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0411/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර හන්තාන වත්තෙන් අක්කර 45 රූඩ් 02 පර්චස් 16 ක බිම් ප්‍රමාණයක් නීත්‍යානුකූල නොවන ඉඩම් හුවමාරුවක් ලෙස ෂාමිනී කිරිඇල්ල සහ පිලිප් ජයවර්ධන යන අය වෙත ලබා දී ඇති බව එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම ලබාදිය හැක්කේ ව්‍යවස්ථාපිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගෙන වුවත්, එම ක්‍රියා මාර්ගය අනුගමනය නොකර එවකට සිටි අමාත්‍යතුමා සහ ජ.න.ව.ස.ම සභාපතිතුමා විසින් එම ඉඩම පවරා ඇත්තේ නීත්‍යානුකූල නොවන ආකාරයකට බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) නීත්‍යානුකූලව පවරා නොමැති නම්, මෙම ඉඩම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නීත්‍යානුකූල නොවන මෙම ඉඩම් ගණුදෙනුවට වගකිව යුත්තෝ කවුරුන්ද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0431/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයා සිය ධූරයේ රාජකාරි භාරගත් දිනයේ සිට අද දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස විදේශ ගතවූ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටේ නම, සංචාරය සඳහා හේතුව, අමාත්‍යවරයා සඳහා වියදම, කැටුව ගිය පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් වෙනුවෙන් දැරූ පිරිවැය, එක් එක් සංචාරය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් සංචාරය තුළින් මෙරට ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 තුළ, වත්මන් අමාත්‍යවරයාට පෙර එම තනතුර දැරූ පුද්ගලයන් ඉහත සඳහන් රටවලටම සංචාරය කළ වාර ගණන කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0556/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009.02.20 දින ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත් වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තු අනුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, කොන්ත්‍රාත් වටිනාකම හා ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) අලුත්වැඩියාවට අදාළ සියලු මුදල් ගෙවා අවසන් කර තිබේද;

(iv) අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර තිබේද;

(v) එසේ නම්, ඊට අදාළ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම කටයුතු අවසන් කිරීමට ගිවිසුම්ගත කාලය කොපමණද;

(iii) මේ වන විට ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු මුළුමනින්ම අවසන් කර තිබේද;

(iv) ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් සෑහීමකට පත් විය හැකි බවට විශේෂඥ වාර්තාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0261/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0557/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත්වූ දේශීය ආදායම් ගොඩනැගිල්ල අලුත්වැඩියා කර අවසන් කරන තෙක් දෙපාර්තමේන්තුවේ අංශ ස්ථාපිත කිරීම සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එක් එක් කුලී ගොඩනැගිල්ලට ගෙවා ඇති මුලු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවායේ කුලී කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ තවදුරටත් කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0262/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් කටුවන කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ගේ විභාග සමත් වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බැව් ඔබතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල මේ වන විට ලියාපදිංචි වී ඇති ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඒවා අතුරෙන් වඩා වැදගත්කමින් යුතු වූද, ඓතිහාසික වටිනාකමින් යුක්ත වූද, ආගමික ස්ථාන 20 හි නම් කවරේද;

(iv) රජය විසින් එම ආගමික ආයතන වෙත වෙන් කර දී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම ආයතනයන්හි වැඩ වෙසෙන පූජකවරුන් සංඛ්‍යාව එක් එක් ආගම අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0558/’10

ගරු අජිත් කුමාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා සම්මාන උළෙල සඳහා සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය නවීකරණය කරනු ලැබුවේද;

(ii) එසේ නවීකරණය කිරීමේදී ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ සිදු කළ වෙනස්කම් පිළිබඳ සම්පූර්ණ විස්තර කවරේද;

(iii) එම නවීකරණය කිරීම් සිදු කරනු ලැබූ ආයතනය කුමක්ද;

(iv) ඊට වැය කළ මුදල කොපමණද;

(v) එම මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ,

(i) නවීකරණයට පෙර අසුන්ගත හැකිව තිබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නවීකරණයෙන් පසු අසුන්ගත හැකි පුදගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?